


# ලෝක කුසලාන ක්‍රිකට් තරගමාලා පහකදී ශ්‍රී ලංකාව නියෝජනය කළ පර්සි



දින 47 ක් පුරා පැවැති 9 වැනි ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය එහි ශූරතාව ඕස්ට්‍රේලියාවටත් අනු ශූරතාව ශ්‍රී ලංකාවටත් අත්පත් කර දෙමින් පසුගියදා නිමාවට පත්විය. වසර 4 කට වරක් පැවැත්වෙන මෙම ලෝක කුසලාන ක්‍රිකට් සැණකෙළිය එකක් රටක් රාජ්‍යයක් පාලනය කළ රජවරුන් මෙන් ක්‍රීඩා පිටියේ බලය පතුරවාගෙන සිටි සුපිරි පිතිකරුවන් හා පන්දු යවන්නන් වැඩි දෙනෙකු තම ක්‍රීඩා දිවිය අවසන් කරන වේදිකාව බවට පත් කර ගැනීමද සාමාන්‍ය තත්ත්වයකි. එසේම හෙට දවසේ ලෝක අවධානයට ලක් විශිෂ්ඨ යොවුන් ක්‍රීඩකයින් හඳුන්වා දීමටද මෙම තරගාවලිය තරම් සුදුසු වෙනත් අවස්ථාවක් ක්‍රිකට් ක්‍රීඩාවට නැත.

කෙනෙකු සමුගත් විට ඔහුගේ අඩුව පිරවීම ඔහුට නොදෙවෙනි සුදුස්සෙකු අතින් සිදුවිය යුතුමය. නොඑසේ නම් ඕනෑම ක්‍රීඩාවක උද්වේග කර බව හීන වී යාමත් ඒ නිසාම ඒ වෙත ඇදෙන ක්‍රීඩක ප්‍රේක්ෂක සහභාගීත්වයද හීන වී එම ක්‍රීඩාව පසුපසට ගමන් කරන්නට වීම සමාන කළ හැක්කේ සුව කිරීමට අපහසු රෝගී තත්ත්වයකටය.

මෙම නව වැනි ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී බ්‍රයන් ලාරා, ග්ලෙන් මැග්‍රාත් හා ඉන්සමාම් උල් හක් වැනි දැවැන්තයින් ක්‍රිකට් පිටියෙන් හෝ එක්දින ක්‍රිකට් ක්‍රීඩාවෙන් හෝ සමුගැනීම ප්‍රකාශ කරද්දී ෂෝන් ටේට්, ලසිත් මාලිංග හා රවීන්ද්‍ර බෝපරා වැනි නව යෞවනයන් ඉස්මතු වූයේ අනාගතයේදී ඇති විය හැකි අඩුපාඩු මකා දමන්නට මෙනි. කෙසේ වුවත් තවමත් සමු ගැනීමකට එක මොහොතකදී හෝ සිතා නැති පුද්ගලයෙකු පසුගියදා බටහිර ඉන්දීය කොදෙව් දූපත් බලා පිටත්ව ගොස් තිබුණි. සිය 5 වැනි ලෝක කුසලාන සහභාගීත්වය සටහන් තැබීම පිණිසය. ඔහුගේ සහභාගීත්වය ශ්‍රී ලංකාව නියෝජනය කරමින් වූ බැවින් එය ශ්‍රී ලාංකික අපට මහත් වූ ආඩම්බරයකි.

මෙම තැනැත්තා පළමු වරට ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියකට සහභාගි වී තිබුණේ 1979 වසරේදීය. එය එම තරගාවලියේ දෙවැන්නය. අනතුරුව ඔහු 1983, 1996 හා 1999 යන තරග මාලාවන්හිදී ශ්‍රී ලංකාව වෙනුවෙන් ඊට සහභාගි වී තිබුණි.

එහෙත් විවිධ හේතූන් නිසා 1987, 1992 හා 2003 යන තරගමාලාවන් හිදී ඔහුගේ නියෝජනයක් සිදු නොවීය. එසේ නොවූයේ නම් මේ දක්වා ඔහු සහභාගි නොවූ එකම ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය ලෙස ලියැවෙන්නේ 1975 වසරේ පැවැති පළමු වන තරගමාලාවය. මේසා දීර්ඝ කාලයක් ශ්‍රී ලංකා ක්‍රිකට් පිල සමග ලෝක කුසලාන ක්‍රිකට් චාරිකාවක නියැලුණු ඒ අසිරිමත් පුද්ගලයා වෙන කිසිවෙකු නොව ශ්‍රී ලංකා පිලේ ඒක පුද්ගල දිරිගන්වන්නා ලෙස ප්‍රකටව සිටින පර්සි අබේසේකරය.

වසර 28 ක් තිස්සේ ශ්‍රී ලංකා ජාතික ධජය ලෙලවමින් ක්‍රීඩා පිටියෙන් ක්‍රීඩා පිටියට යමින් සිංහ නාද නැංවූ පර්සි අද 70 හැවිරිදි විය ඉක්මවූ තැනැත්තෙකි. හැට පැන්නද වඳුරාට බිමින් ගමන නුපුරුදු යම් සේද පර්සි අබේසේකරටද ඈත රටක නුහුරු පරිසරයකදී වුව සිංහ කොඩිය ඔසවා ගෙන ක්‍රීඩාංගණය වටේ දිව යමින් ශ්‍රී ලංකා පිල දිරිගැන්වීම දැන් නතර කළ නොහැක්කක් වී ඇති සේය.

ටෙස්ට් තත්ත්වය අහිමි රටක් ලෙස ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියකදී ටෙස්ට් තත්ත්වය හිමි රටක් පරාජය කළ ගෞරවය පළමුවෙන්ම අත්කර ගත්තේ ශ්‍රී ලංකාවය. එම ගෞරවය අත්කර දෙන්නට එදා පර්සි ද ශ්‍රී ලංකා පිලට සෑහෙන උපකාරයක් වී තිබුණි. ඉන්දියාව පරදවා ලකුණුන 47 ක ජයග්‍රහණයක් අත්කර ගත් එම තරගයේදී දුලිප් මෙන්ඩිස් ලබාගත් ලකුණු 64 ශ්‍රී ලංකා පිලට බොහෝ ප්‍රයෝජනවත් විය. දුලිප් මෙන්ඩිස්ට එම ලකුණු 64 ලබා ගන්නට උපකාර කර තිබුනේ පර්සි අබේසේකරය. ඒ අවස්ථාවක මෙන්ඩිස් ඉහළින් එල්ල කළ වේගවත් පහරක් හතරේ සීමාව අසල රැඳී සිටි බිෂන් සිං බෙඩී රැක ගන්නට සූදානම් වෙද්දී ඒ මොහොතේ ඔහු ආසන්නයේ සිංහ ධජය ද සහිතව රැඳී සිටි පර්සි එක්වරම ''ඔන්න බෙඩී නුඹේ පිටුපසින් බල්ලෙක් ඉන්නවා'' යයි ඉංග්‍රීසි භාෂාවෙන් කෑ ගසා කියා ඇත.

පර්සිගේ ප්‍රකාශයෙන් පන්දුව වෙත තිබූ බෙඩීගේ දෑත් ඉන් ඉවත් විම නිසා ඔහු අතින් එම උඩපන්දුව ගිලිහී ගියේය. ඒ අවස්ථාවේ දැවී යාමෙන් බේරුණු දුලිප් මෙන්ඩිස් ලකුණු 64 ක් රැස් කළේය.

ශ්‍රී ලංකා ලෝක කුසලාන දිනූ 1996 තරගාවලියේ ඉන්දියාව සමග වූ අවසන් පූර්ව තරගය පැවැති ඊඩන් ගාඩන් ක්‍රීඩාංගණයට ඇතුල්වීමට පර්සිට පැය 4ක කාලයක් පෝලිමේ සිටින්නට සිදුවී තිබුණි. ක්‍රීඩා පිටියට ඇතුල් වූ මොහොතේ පළමු පන්දු වාරයේදීම ශ්‍රී ලංකා පිලේ ආරම්භක පිතිකරුවන් වූ සනත් ජයසූරිය හා රොමේෂ් කලුවිතාරණ යන පිතිකරුවන් දෙදෙනා දැවී යනු පර්සි දුටුවේය. ඒ මොහොතේ ඔහු ''ඉතිපිසෝ භගවා අරහං'' යනුවෙන් ගාථා මුමුණමින් ක්‍රීඩාපිටිය වටේ දිව ගිය අයුරු පර්සිට තවමත් හොඳට මතකය. කොහොම නමුත් ඉන්දියාව පරාජය වූ එම තරගයේදී පර්සි ඉන්දියානුවන්ගේ ඇපල් ප්‍රහාරයකටද ගොදුරු වී තිබුණි.

සිදත් වෙත්තමුණි 1984 වසර් එංගලන්තයෙ ලෝඩ්ස් ක්‍රීඩාංගණයේ පැවති ටෙස්ට් තරගයේදී ලකුණු 190 ක් රැස් කළේය. සිදත් ශ්‍රී ලංකා පිල සමග එංගලන්තයට ගොස් සිටියදී ශ්‍රී ලංකා පිල දිරිගැන්වීම සඳහා එංගලන්තය බලා පිටත්වූ පර්සි අතේ සිය සොහොයුරා වෙත මිත්‍ර වෙත්තමුණි විසින් අනතුරු ඇඟවීමේ පණිවිඩයක්ද යවනු ලැබීය. ''ඔබ ලෝඩ්ස් ක්‍රීඩාංගණයේදී ශතකයක් වාර්තා නොකර නැවත ශ්‍රී ලංකාවට එන්න එපා'' එම පණිවිඩයේ සඳහන් විය. ඒ වනවිට ලෝඩ්ස් ක්‍රීඩාංගණයේ පුහුණුවීම්වල නිරතව සිටි සිදත්ට ඔහු මිත්‍රගේ පණිවිඩය ලබා දුන්නේය.

ලෝඩ්ස් තරගයේදී තමන්ට නැවත ශ්‍රී ලංකාවට යන්නට තිබූ බාධකය ඉවත් කර ගන්නට සිදත් වෙත්තවුණිට හැකි විණි. මේ කාලයේ ශ්‍රී ලංකාව එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදයට ගොදුරුව පැවති බැවින් සිංහ ධජය සහිතව ලෝඩ් ක්‍රීඩාංගණය වටා සිදුකරණ පර්සිගේ ගමනට එංගලන්තයේ වෙසෙන එල්.ටී.ටී.ඊ. හිතවාදී දෙමළ ජාතිකයන්ගේ විරෝධය එල්ල වී තිබුණි. මේ නිසා තම කටයුත්තට එංගලන්ත පොලීසියේ විශේෂ අවසරයක් ලබා ගන්නටද පර්සිට සිදුවී තිබුණි. ඒ හැර එදා ලෝඩ්ස් ක්‍රීඩාංගණයේදී මේ ඒක පුද්ගල දිරිගන්වන්නා අපහසුතාවට පත් කිරීමට එංගලන්ත ජාතිකයින්ද බොහෝ උත්සාහ ගත්තේය.

වරක් එක් පුද්ගලයෙකු පර්සි අමතා ඔය කොඩියෙ ඉන්නෙ මොන සතා දැයි ප්‍රශ්න කර තිබුණි. එවිට නුඹ අන්ධ විද්‍යාලයෙන් පැමිණි කෙනෙක්දැයි පර්සි ඔහුගෙන් පෙරළා ප්‍රශ්න කර ඇත. ඉන් නොසැලුණු ප්‍රතිවාදියාද පර්සි පැවසූ දේ නොඇසුනු පරිදි ඒ බැටළුවෙක් (Lamb) නොවේදැයි විමසනු ලැබීය. අපේ රටේ බැටළුවන් නැහැ. බැටළුවො ඉන්නෙ නුඹලගෙ රටේ මතක නැද්ද නුඹලගෙ ක්‍රිකට් කණ්ඩායමෙත් බැටළුවෙක් හිටියා.'' පර්සි එසේ පැවසුවේ ඇලන් ලෑම්බ් පිළිබඳ ඔහුට සිහිපත් කර දෙමිනි.

ඉනුදු නොනැවතුණු පර්සි ''අපේ කොඩියේ ඉන්නේ සිංහයෙක් උෟ හරි එඩිතර සතෙක්. නුඹලාගේ රටේ මිනිසුන්ගේ වාසගම් බලන්න පොක්ස්, ලෑම්බ්, බූල්, බුචර්, කාපෙන්ටර්, යාර්ඩ්, :ත්‍දංල බ්ඉපල ඊමකකල ඊමඑජයැරල ඝ්රචැබඑැරල ශ්රා* නුඹලට හොඳ වාසගමක්වත් නැහැ. මට ඔබේ මුහුණ බැලුවම වාසගම උනත් කියන්න පුළුවන්. ඔබ යාර්ඩ් :ශ්රා* කෙනෙක්. ඔව් ඔබ ග්රේව් යාර්ඩ් :ඨර්ඩැ ශ්රා* හරි ද?'' මේ ආකාරයෙන් ඔහු එදා ඒ එංගලන්ත ජාතිකයා අසීරුවෙන් අසීරුවට පත් කළේය.

ශ්‍රී ලංකා පිල ලබාගත් ජයග්‍රහණයකදී තම දෑතේ ලෙලදුන් සිංහල ධජය පරාජය වූ මොහොතකදී වුව පර්සි අතින් ගිලිහී ගියේ නැත. දහවැලි ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය පැවැත්වෙන්නේ 2011 වසරේ ආසියානු කලාපයේය. එම තරගාවලියේදී ශ්‍රී ලංකා පිලේ දිරිගන්වන්නා ලෙස පර්සි අබේසේකර දැකීම ක්‍රීඩාලෝලී ශ්‍රී ලාංකිකයින්ගේ එක් පැතුමකි. එසේම එහිදීද ඔහු ක්‍රීඩා පිටියෙන් සමුගැනීම සටහන් නොකරණු ඇතැයි යන්න ඔහුගේ අනෙක් පැතුමය.

පර්සිගේ ප්‍රියාදර බිරිඳ මෙලනිය. පර්සි ශ්‍රී ලංකා ක්‍රිකට් පිලේ ඒක පුද්ගල දිරිගන්වන්නා ලෙස නොමඳ පැසසුම් සහිතව වසර 28 ක දීර්ඝ මෙන්ම සතුටුදායක සේවාවක නියැලී සිටියි. පර්සි අබේසේකර ශ්‍රී ලංකා ක්‍රිකට් පිලේ දිරිගන්වන්නා ලෙස ඉතාමත් සාර්ථක චාරිකාවක නියැලෙන්නේ මෙලනිගේ දිරිගැන්වීම මත යයි සඳහන කිරීම සර්ව සාධාරණය.

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila